# බස්නාහිර පළාතේ පළාත් සභාව
## *மேல் மாகாண மாகாண சபை*
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 සැප්තැම්බර් මස 04 වන සඳුදා**
2017 புரட்டாசி 04 திங்கட் கிழமை
Monday 04th September 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்லஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.31 ට පළාත් සභාව රැස් විය.**
**மு.ப. 09.31 க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.31 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. බාධා කිරීම් කරන්න එපා. මම දැන් එද්දිත් එක්කෙනෙක් කෑ ගහනවා බොත්තම් දා ගෙන නැහැයි කියලා. මම එන්න ඉස්සෙල්ලා මගේ නිල කාමරයට ඇහුණා, සමහර අය ගරු සභාපතිතුමා කියලා නිවේදනය කරනවා. එහෙම කරන්න එපා. ඒවා කොපමණ අශෝබනද? මයික්‍රෆෝනය පාවිච්චි කරන්න එපා. ගරු සභාපතිතුමා කියනවා මට දෙපාරක් ඇහුණා. කවුරු කිව්වත් ඒක වැරදියි. ආණ්ඩු පක්ෂයෙන් කිව්වත් විපක්ෂයෙන් කිව්වත් වැරදියි ඒක. ඒ නිසා එහෙම කරන්න එපා. මට නොවෙයි. සෙංකෝලයට ගරු කරන්න. මම එන කොට නොයෙකුත් බාධා කිරීම් කරනවා. අනික් එක මූලාසනයේ ඉන්න මන්ත්‍රීවරුත් බාධා කිරීම් කරනවා. මට තිබෙන ප්‍රශ්නය ඒකයි. මූලාසනයට නගින එක්කෙනත් දන්නේ නැහැ, එයා මොකක්ද කරන්නේ කියලා. ඒ නිසා මම කනගාටු වෙනවා. පසුගිය සභා වාරයේදී අවාසනාවන්ත සිදුවීමක් ඇති වෙලා අපි හැමෝම අපි ගරු කරන සෙංකෝලයට අලාභහානි සිද්ධ වුණා. ඉදිරියේදී අපි ඒක නැවත තිබූ පරිදි යථා තත්ත්වයට පත් වෙනවා. වාසනාවට ලොකු හානියක් සිද්ධ වුණේ නැහැ. ඒ පිළිබඳව මම ඉදිරියේදී කැමරා සහ මාධ්‍ය තොරතුරු බලලා, පසුව සභා කටයුතු කාරක සභාවේදී ඒ ගැන සාකච්ඡා කරලා අපි ඒ ගැන තීන්දුවක් ගන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member


සංවිධායකතුමා කියපු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ගණන් ගන්නේ නැහැ ඒවා. මම කේන්ති යන මන්ත්‍රීවරයෙකුත් නොවෙයි. ඒවා ඉවරයි. එදා ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මොනවා හරි කිව්වා, ඒවා ඉවරයි.

2017.08.28 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එකඟතාවය පරිදි අද දින සභාවේ වැඩ කටයුතු පොදු කටයුතු විෂයයට පමණක් සීමා වන පරිදි කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව මෙම සභාවට දැනුම් දෙනවා. එම නිසා අද දින න්‍යාය පත්‍රයට ප්‍රශ්න හා පෞද්ගලික පැහැදිලි කිරීම් යන විෂයයන් ඇතුළත් නොවන බවත් කාරුණිකව දැනුම් දෙනවා.

ඊත් එක්කම ගරු ආණ්ඩුකාරතුමා ඊයේ උදේ මගේ නිවසේ මම ඉන්න කොට දුරකථනයෙන් මට කථා කරලා, එතුමා මගෙන් ඉල්ලීමක් කළා. එතුමාගේ නිවේදනයක්. එතුමාගේ ඉල්ලීමක්. ඒ අනුව මට දහවල් දොළහ පමණ වන විට මගේ නිවසට ෆැක්ස් පණිවුඩයක් එව්වා. ඒක මම මේ අවස්ථාවේදී සභාවේ දැන ගැනීම පිණිස මෙම සභාවට ඉදිරිපත් කරනවා.



කේ. සී. ලෝගේස්වරන්
கே. சீ. லோகேஸ்வரன்
K. C. Logeswaran
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර
மேல் மாகாண ஆளுநர்
Governor, Western Province

Telephone Nos. 0112334371, 0112334088
Fax 0112334370
E-mail governor@governor.wpc.gov.lk

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
5 වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල
අංක 109, ගාලු පාර,
කොළඹ 03,
ශ්‍රී ලංකාව.

ஆளுநர் செயலாளர் பணிமனை
5ம் மாடி, ரொட்டுண்டா கோபுரம்,
இல. 109, காலி வீதி,
கொழும்பு 03,
இலங்கை.

Secretariat of the Governor
Level 05, Rotunda Tower,
No. 109, Galle Road,
Colombo 03,
Sri Lanka.

මගේ අංකය: GOS/ADM/40/නීති කටයුතු මිශ්‍ර

දිනය:2017.09.02

ගරු සභාපතිතුමා,
බස්නාහිර පළාත් සභාව.

ගරු සභාපතිතුමනි,

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබතුමාගේ සමාංක හා 2017.08.28 දිනැති ලිපිය හා සම්බන්ධවයි.

02. එම ලිපියේ සඳහන් ඉල්ලීම පරිදි ජනාධිපති ලේකම්ගේ අංක CSA/9/9/6 හා 2017.09.01 දිනෙන් මා වෙත එවන ලද ලිපිය අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම් පත සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම පිණිස ලබා දුන් කාල සීමාව 2017.08.31 දින සිට දින 14කින් දීර්ඝ කිරීමට එකගතාව අතිගරු ජනාධිපතිතුමන් විසින් පල කර ඇති බව කාරුණිකව දන්වමි.

03. එසේ හෙයින් මෙම සංශෝධනය පිළිබඳ බස්නාහිර පළාත් සභාවේ අදහස් දැක්වීම අතිගරු ජනාධිපතිතුමන් වෙත යොමු කිරීමට හැකි වන පරිදි 2017.09.12 දිනට පෙර දැනුම් දෙන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට-විශ්වාසී

කේ.සී. ලෝගේස්වරන්
ආණ්ඩුකාරවර(බස්නාහිර පළාත)

[ගරු සභාපතිතුමා]

එතුමා මා වෙත ඊයේ යොමු කරන ලද ලිපිය. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. මට මොහොතකට කල් දෙන්න. මොකද, න්‍යාය පත්‍රයේ පුංචි කාරණා දෙකක් තිබෙනවා ඉදිරිපත් කරන්න. ඒක සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ. මම ඒ නිවේදන කළාට පස්සේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව තිබෙනවා. මම හිතනවා, එතුමා සභාවට පැහැදිලි කිරීමක් කරයි. අපි ඒ අනුව ඉදිරි කටයුතු කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලිපි ලේඛන පිළිගැන්වීම යටතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට හෝ එතුමා වෙනුවෙන් වෙනත් ගරු අමාත්‍යවරයෙකුට අවස්ථාව ලබා දෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ පනත් කෙටුම්පත පිළිගැන්වීමට. ගරු ප්‍රධාන අමාත්‍යතුමා.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, ඔබතුමා විසින් මේ සභාවට ප්‍රකාශ කරන ලද ලිපියට අනුව - අද දින ඔබතුමා අමතා ගරු ආණ්ඩුකාරතුමා කරන ලද ලිපියට අනුව, විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ යෝජනාව අද මම මේ සභාවට ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ වෙනුවෙන් ඔබතුමා ප්‍රකාශ කළ පරිදි ලබන සඳුදා තෙක් කාලය ලබා දෙන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මට සමාවෙන්න. මේ න්‍යාය පත්‍රයේ තව පුංචි කාරණා කිහිපයක් තිබෙනවා මට මේ සභාවට පිළිගන්වන්න. ඔබතුමා එහෙම නම් ඒ ප්‍රකාශය ඊට පස්සේ කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීට පෙර ඒ පනත් කෙටුම්පත සභා මේසය මත තබා තිබෙනවා. මේ වන කොට සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ලැබිලා තිබෙන්නේ.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017.08.22, 2017.08.23 හා 2017.08.28 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම්හි වාර්තාවන් තුනක් මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්නවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු උදාර රත්නායක**
Hon. Udara Rathnayake

ගරු සභාපතිතුමනි, අළුබෝමුල්ල, පමුණුගම, සඳගලවත්ත, අංක 74/12 හි පදිංචි කාන්ති යමුනා පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, පානදුර, මාලමුල්ල, කිරිබේරිය පාර, අංක 372/ D හි පදිංචි එස්. සාලිය අතුල සහ පානදුර, පල්ලිමුල්ල, 195/6 හි පදිංචි එච්. දසන්ත කුමාර පෙරේරා යන අයවලුන්ගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee.*

# පළාත් සභාවේ කටයුතු
## PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.) [On Behalf of Minister of Council Affairs]

ගරු සභාපතිතුමනි, *"අද දින සභා රැස්වීමේ වැඩ කටයුතු පොදු කටයුතු විෂය සඳහා පමණක් සීමා විය යුතු අතර, එම වැඩ කටයුතු සඳහා රීති අංක 15(4), 57(1), 57(3), 57(4) හා 57(5) හි විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතු ය"* යන යෝජනාව මම සභාවට ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් න්‍යාය පත්‍රයේ මෙහෙයවීම් කටයුතු අවසන් වෙනවා. ඒ නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ කාරණය සම්බන්ධව. මම දැන ගන්න කැමැතියි, ඔබතුමා මතක් කළා වාගේ මේක 11 වැනිදා දක්වා ගෙනියන්න හේතුව. එක්කෝ උසාවියට එල්ල වෙලා තිබෙන නඩුවක් සම්බන්ධවද? එහෙම නැත්නම් ජනාධිපතිවරයාත්, අගමැතිවරයාත් මේ පිළිබඳව මහ ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා දැනුම් දීම පිළිබඳව කියන කාරණා දෙකෙන් කොයි කාරණාවට ද වඩා එකඟ වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, මේ සම්බන්ධව මම මොකුත් දන්නේ නැහැ. මොකද, ආණ්ඩුකාරතුමාගේ ලිපිය තමයි මට එවලා තිබෙන්නේ. මම හිතන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ ගැන විස්තර දන්නවා. ඒ නිසා මම එතුමාට ආරාධනා කරනවා මේ සම්බන්ධව -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, අද දින මම මේ යෝජනාව කරන්නේ ජනාධිපති ලේකම්තුමා ගරු ආණ්ඩුකාරතුමා අමතා මා වෙත එවන ලද පිටපත අනුව. ඒ අනුව මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා එක්ක අපි කථා කළා. ඒ වාගේම මේ පිළිබඳව අවබෝධයක් තිබෙන අයත් එක්ක කථා කළාම අපට පැහැදිලි වුණේ, දැන් 6 වැනිදාට මේ සම්බන්ධයෙන් උසාවියේ නඩු කිහිපයක් සාකච්ඡා වෙනවා. එතකොට රජය මට්ටමෙන් අපට පූර්ව දැනුම් දීමක් කරලා තිබෙනවා, ඒ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ලිඛිත සංශෝධනයන් අපට කරන බවට. අනික් එක බස්නාහිර පළාත් සභාව විසුරවන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමාවෙන්න. යෝජනාව ඉදිරිපත් කරන්නේ නැහැයි කියලා ඔබතුමා මුලින් ප්‍රකාශ කළා නේ? නමුත් සභාවට ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරලා කථා කරන්න. පිළිගන්වන්න. ලේඛනය පිළිගන්වන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

යෝජනාව ඉදිරිපත් කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

යෝජනාව ඉදිරිපත් කරන්න බැහැ. අපි ගිය සැරෙත් ඉදිරිපත් කළේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම්තුමා කියනවා, පනත සභාගත කිරීමක් අවශ්‍ය වෙනවා කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක සංශෝධනය වෙන නිසා සභාගත කරලා වැඩක් නැහැ නේ? සංශෝධනයෙන් පසුව මේක අපි ඉදිරිපත් කරන්නම්.

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

මොකද, අපට දැනුවත් කරනවා, මේ පනත සම්බන්ධයෙන් සංශෝධන පනත් කෙටුම්පතක් අපට ලබන සඳුදාට ඉස්සෙල්ලා ඉදිරිපත් කරනවාය කියලා. අනික් එක දැන් පැහැදිලිව කියන්න ඕනෑ එක දෙයක් තමයි, බස්නාහිර පළාත් සභාව විසුරුවීමට නිල කාලය තිබෙන්නේ, 2019 අප්‍රේල් 21. එතකොට කිසිම පළාත් සභාවක මහ ඇමතිවරයෙක්, තමන්ගේ පළාත් සභාව නියමිත කාලයට පිටින් විසුරුවීමට එකඟ වෙන්නේ නැහැ. ඒ සභාවත් එකඟ වෙන්නෙත් නැහැ. මහ ඇමතිවරයෙක් එකඟ වෙන්නෙත් නැහැ. ඒ වාගේම මේ ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පතේ මහ ඇමතිවරයාගේ, ආණ්ඩුකාරවරයාගේ, මේ රටේ විධායක ජනාධිපතිවරයාගේ බලය හීන කිරීමක් අන්තර්ගත වී තිබෙනවා. එතකොට අපට ඒකට එකඟ වෙන්නත් පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි යෝජනා කරන්නේ, මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා ඇතුළු රජයේ වගකිවයුතු අයට අපි දැනුවත් කරලා තිබෙනවා. අගමැතිතුමා එක්කත් දුරකථනයෙන් මම මේ ගැන කථා කළා. එතකොට අපි පැහැදිලිව කිව්වා, අපට එකඟ වෙන්න පුළුවන් වෙන්නේ 2019 දක්වා යන ගමනකට විතරයි කියලා.

ඒ නිසා අපි ඉතාමත් ගෞරවයෙන් මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. මේ එවලා තිබෙන පනත් කෙටුම්පතට අදාළව අපට එකඟ වෙන්න පුළුවන් විධියේ කාරණා ඇතුළත් සංශෝධනයක් ලැබෙන බවට අපට දැනුම් දීලා තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. මේ පනත සාකච්ඡා කිරීම සඳහා එළැඹෙන සඳුදා තෙක් මේ සභාව කල් තියන්න අවසර දෙන්නය කියලා. එදාට අපට මේ සම්බන්ධයෙන් නැති වුණොත් අපි සභාව එකඟ වෙලා ගන්නා තීන්දුවක් යවන්න අපි පොරොන්දු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, දැන් මේ කාරණය සම්බන්ධව අපට පිටු දෙකක සංශෝධනයක් එවලා තිබෙන්නේ. මහ විශාල දෙයක් නැහැ. දැන් ඇත්තටම මේක ඉදිරිපත් නොකළාට මේකේ අදහස දැන් ගරු මහ ඇමැතිතුමා කියලා ඉවරයි. මේ සම්බන්ධව. දැන් අපේ අදහස කියලා නැහැ. එතුමාගේ අදහස කියා ගත්තා. ඒක නිසා -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පොඩ්ඩක් ඉන්න. ගරු මන්ත්‍රීතුමා දැන් මම කථා කරනවා නේ. පොඩ්ඩක් ඉන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක නිසා මේක සෙල්ලමක් නොවෙයි. අපි සියලු වැඩ කටයුතු පැත්තකින් තියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් වාඩි වෙන්න. අර ගරු මන්ත්‍රීතුමාගේ රීති ප්‍රශ්නයක්. පොඩ්ඩක් ඉන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි,

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මමත් රීති ප්‍රශ්නයක් තමයි. රීති ප්‍රශ්නයක් බවට පත් වෙනවා, මේ සභාවේ -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, කාර්යපටිපාටි රීති 64(3) පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ආණ්ඩුකාරතුමාගේ අභිමතය පිළිබඳව අපට සාකච්ඡා කිරීමට අවස්ථාවක් නැති බව පැහැදිලිව මතක් කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, දැන් රීති අත්හිටුවලා තිබෙන්නේ. ඔය කියන ආකාරයට. මේක මේ සෙල්ලමක් නොවෙයි. අඩුම ගණනේ මේ සම්බන්ධව කලින් වගකිවයුත්තෝ දැනුම්

දෙන්න තිබුණා. ඇත්තටම ඒ අතින් බලනකොට මේ සංශෝධනය හරි. මොකද, මේ සංශෝධනය අනුව මොකක් හරි එකක් සංශෝධනය වෙනවා නම්, පාර්ලිමේන්තුවේ අවසරය ගන්න ඕනෑ. විසුරුවා හරිනවා නම් හරි. එතකොට 225 කට අයිතිය ගිහිල්ලා තිබෙන්නේ. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් මේ සභාවේ ගරුත්වයක් නැහැ, ගරු සභාපතිතුමා. මේක මන්ත්‍රීවරු නොවෙයි තීරණය කරන්නේ. කවුරු හරි ලියුමක් එව්වාට පස්සේ ඒ ලියුම අනුව අපි එක්කෝ මෙතැනට එනවා. ඊට පස්සේ යනවා යන්න. මේකේ තේරුම මොකක්ද? දැන් අපට පිළිගන්න තිබෙන්නේ, ආණ්ඩුකාරතුමා එවපු ඔබතුමා කියවපු එක. ඒකේ තිබෙනවා, 12 වැනිදාට ඉස්සෙල්ලා දැනුම් දෙන්න කියලා. නැතුව ඒ ලියුම ඇතුළේ නැහැ, අපට මේ සභාව කල් දාන්න කියලා. ඒ නිසා කළ යුත්තේ ඒ සම්බන්ධව මේ සභාවේ සාකච්ඡා කරන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තත්ත්පරයක් ඉන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මන්ත්‍රීවරු හැටියට අපි මෙතැන පිළිගන්නේ ඔබතුමා කියන එක. නැත්නම් වෙන කවුරුවක්වත් කියන එකක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මමත් පිළිගන්නේ සභාවේ මතය.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කවුරු හරි එවපු ලියුමක් කියවන එකක් නොවෙයි. අපට එහෙම ලියුමක් ඇවිල්ලත් නැහැ. අද සියලු වැඩ කටයුතු පැත්තකට දාලා අද මේ ඇවිල්ලා තිබෙන්නේ සභාවේ සාකච්ඡා කරන්න. ඒ නිසා ඉස්සරහාට මොකක් හරි සංශෝධනයක් එනවා නම්, ඒ සංශෝධන පිළිගන්වාද? නැද්ද? කියන එක පස්සේ තීරණය කරන්න පුළුවන්. දැනට අපට ඇවිල්ලා තිබෙන්නේ මේ කෙටුම්පත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ යුතුකම තමයි ගරු ආණ්ඩුකාරතුමා මා වෙත එවන ලද ලිපිය සභාවට ඉදිරිපත් කිරීම. මම ගරු කරන්නේ සභාවට. මම සභාවට ගරු කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ අනුව අපි 12 වැනිදාට ඉස්සෙල්ලා යවන්න තිබෙනවා. එච්චරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව් ඉතින්. එච්චරයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ආපහු කල් දාන්න කියලා එකක් ඕකේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොහෙවත් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙමනම් අද සාකච්ඡා කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් ගරු මහ ඇමැතිතුමා ඉල්ලීමක් කරනවා නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙමනම් ඔබතුමා අද සාකච්ඡාවට ගන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
**Hon. Isura Devapriya - Chief Minister**

අපට දැනුම් දීලා තිබෙනවා, මේ සම්බන්ධයෙන් සංශෝධනයක් ඒනවා කියලා. ඒ අනුව තමයි -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මන්ත්‍රීවරු හැටියට අපට දැනුම් දීලා නැහැ.

[සභාවේ ඝෝෂා]

එහෙමනම් ඒ දැනුම් දීම මේ සභාවේ සභාගත කරන්න ඕනෑ. මේක මරණාධාර සමිතියක් නොවෙයි.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Animal Production and Health and Agrarian Development.)

ආණ්ඩුකාරවරයා සභාපතිතුමාට මේවා එව්වාම සභාගත කරන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සභාගත කරන්න ඕනෑ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

පෞද්ගලිකව හැම එක්කෙනාටම -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අද විශේෂ සභාවක් නොවෙයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා දැන් මෙතැනට ආපු ගමනුත්, ඔය ආසනයේ ඉඳගත්තු ගමන් කිව්වේ මේ සභාවේ ගරුත්වය ගැන. ඒ ගරුත්වය රකින්න නම් මේකේ නිශ්ශබ්දව ඉන්න එක නොවෙයි ඇති වැඩේ. නීත්‍යානුකූලව කටයුතු කරන එක. ඔබතුමාට තිබෙන්නේ, ඔබතුමාට ලැබුණු ඒ ලියුම අනුව කටයුතු කරන එක. තව දවසකට කල් දාන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයක් නැහැ. සභාවට ඉදිරිපත් කළා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා බලාපොරොත්තු වුණා, එතුමාට ඉහළින් ලැබුණු උපදෙස් අනුව සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරන්න. ඒකයි ගරු මහ ඇමැතිතුමා ප්‍රකාශයක් කරලා ඉල්ලීමක් කළේ. මම සභාවට ගරු කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපි කියන්නේ ඒ සංශෝධන ඉදිරිපත් කිරීමට බාධාවක් නැහැ. අද අපි සියලු වැඩ පැත්තකට දාලා අරගේ 104 කට කෑම උයලා තිබෙනවා. මේ ජනතාවගේ සල්ලි. හරි. එහෙම නැත්නම් මම ඔබතුමාට යෝජනා කරනවා. ඔය උයපු කෑම ටික අරගෙන මේ 104 ම රාජගිරිය හන්දියට ගිහිල්ලා දන්සලක් දෙමු. අඩුම ගණනේ ඒක ප්‍රයෝජනයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මෙතැන ඇවිල්ලා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ තේ බීලා ඉවර වෙලා මෙතැන මේ මොකක් හරි කරලා කල් දානවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙතුමා මේ දේශපාලනය ගැන කථා කරන්නේ. අපි කථා කරලා තිබෙන්නේ -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ තිබෙන්නේ ගෙදර අර්බුද. ඒ ගෙදර අර්බුද ගෙදර විසඳගන්න ඕනෑ. ඒක අපට අදාළ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමා, මෙතුමා කථා කරන්නේ දේශපාලන ප්‍රශ්නයක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක ගෙදර අර්බුදයක්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අපි කථා කරන්නේ සභාව ගැන. ඒ නිසා ඔබතුමා තීන්දුව ගන්න කෝ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම දැනගන්න කැමැතියි, මේ මහ එන සංශෝධනවලටද සභාව කල් තියන්නේ? මහ එන සංශෝධනවලට. නිල වශයෙන් කාටද දැනුම් දීලා තිබෙන්නේ. එහෙම සංශෝධනයක් එනවා කියලා. එහෙම මොකක්වත් නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

සංශෝධන ගේන්නේ කොහොමද? අධිකරණයේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳව පිළිගන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ නාඩගම මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් ගරු ආණ්ඩුකාරතුමා එවපු ලියුම මට පිළිගන්න සිද්ධ වෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, අද විශේෂ මහ සභාවක් නොවෙයි. අද සාමාන්‍ය සභාව පැවැත්වෙන දිනයක්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි,

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

සාමාන්‍ය සභාවකත් සභා රීති බලන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අද විශේෂ මහ සභාවක් නොවෙයි මේ තිබෙන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති ප්‍රශ්නයක්. පොඩ්ඩක් ඉන්න කෝ. ඔක්කොම කථා කළොත් මට ප්‍රශ්නයක් වෙනවා. ගිය සැරේ වාගේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු ආණ්ඩුකාරතුමා එවන නියෝගවලට අපි යටත් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරපු යෝජනාවට සභාව එකඟද? ගරු ප්‍රධාන අමාත්‍යතුමා යෝජනාවක් ඉදිරිපත් කළා. සභාව එකඟද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමා,

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි,

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මමයි මුලින් නැඟිට්ටේ. ඊට කලින් මට අවස්ථාව දෙන්න.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමා මමයි මුලින් නැඟිට්ටේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මම සභාවේ එකඟතාවය ඇහුවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි. පළාත් සභා රීති සංග්‍රහයේ 67(7) අනුව මේ වන විට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත 2017/20 සිට 2017/31 දක්වා නඩු 12 ක් ගොනු වෙලා තිබෙනවා. ඒ නිසා සභා කාර්යපටිපාටි රීති අනුව 67(7) අනුව මේ ගරු සභාවට බලයක් නැහැ, ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඔබතුමාගේ මතය වැරැදියි. ඒ වාගේ වැරැදි අදහස් ඉදිරිපත් කරන්න එපා. මේක ඇවිල්ලා අග්‍රාමාත්‍යතුමා විසින් මත විමසීමක් කරන්නේ. (බාධා කිරීම්) ඒක වෙනස්. ඒක සම්පූර්ණ බොරුවක්. මේක සභාවේ විවාද කරන්න පුළුවන්.

[සභාවේ සෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

බලයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියන එක මට ඇහුණේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මීට ඉහත ගියවර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නය මොකක්ද? රීති ප්‍රශ්නයක්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

රීති ප්‍රශ්නයක්. ගියවර සභාවේදී ඔබතුමා මහ ඇමැතිතුමාගේ ඉල්ලීම පිට ලිපියක් නැතිව, ආණ්ඩුකාරතුමාගේ ලිපියක් නැතිව එතුමාගේ ඉල්ලීම පිට මෙතැන ඡන්දය විමසලා එදා සභාව කල් තිබ්බා. එදා අපි විරුද්ධ වුණේ - අපට එක එක අය ඒකාබද්ධ විපක්ෂයේ අය හැටියට තල්ලු කෙරුවාට අපි විරුද්ධ වුණේ, ආණ්ඩුකාරතුමාගෙන් ලිපියක් නැතිව කල් තියන්න එපා කියන එක. අපි එදා කිව්වේ. එදා අපි විරුද්ධ වුණේ. අද මෙතුමාට ගරු කරන්නේ අද ආණ්ඩුකාරතුමාගෙන් සහ ජනාධිපති ලේකම්තුමාගේ අනුමැතිය අනුව ලිපියක් ලැබිලා තිබෙනවා, සැප්තැම්බර් මාසයේ 12 වැනිදාට පෙර මේ සභාව කැඳවලා මතය විමසලා එවන්න කියලා. ඒ නිසා එදා ඔබතුමා ඡන්දය විමසුවා නම්, අදත් ඡන්දය විමසන්න ඕනැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඒක තමයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මොකද ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලියුමක් -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa
ගරු සභාපතිතුමනි,

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුකාරතුමාගේ ලිපියක් නැතිව ඡන්දය විමසුවා නම්, අද ඔබතුමා මේකටත් ඡන්දය විමසන්න ඕනැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඡන්දය විමසන්න පුළුවන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඡන්දය විමසලා තීන්දුවක් ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියන්නේ ගරු මහ ඇමැතිතුමාගේ යෝජනාවට ඡන්දය දෙනවයි කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ. නැහැ. අපි ආණ්ඩු පක්ෂයේ -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කබරගොයි තලගොයි වෙනවා. තලගොයි කබරයි වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ජනතා විමුක්ති පෙරමුණ අදහසක් ප්‍රකාශ කළා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජෝර්ජ් නිහඬයි දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර මේ ප්‍රශ්නයට මට උදව් කරන්න. දැන් ආණ්ඩුකාරතුමාගේ ලිපිය මම ඉදිරිපත් කළා. එතුමාගේ ලිපිය පැහැදිලිව මම ප්‍රකාශ කළා. ආණ්ඩුකාරතුමාගේ ලිපිය පැහැදිලිව ප්‍රකාශ කළා. ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කළා. අපේ ගරු විපක්ෂ නායකතුමාත් අදහස් ප්‍රකාශ කළා. ඒ නිසා දිගින් දිගටම මට සාකච්ඡාවකට යන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කවුරු හරි ඉල්ලනවා නම් ඡන්දයක් තියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරපු යෝජනාවට සභාව එකඟද? මට ඒක කරුණාකර කියන්න. සභාව එකඟද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම යෝජනාවට සභාව එකඟද? ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉල්ලීමක් කළා, -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම ඉස්සෙල්ලාම යෝජනා කරනවා. මෙතුමන්ලා ඔය කියන විධියට සංශෝධන දන්නවා. ඒ නිසා එම සංශෝධන සහිතව මෙම යෝජනාව අපි සාකච්ඡා කරමු.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම නැත්නම් අපි එකඟ නැහැ. කල් දානවාට එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බෙදීමක් තිබෙන නිසා සභාවේ සීනුව නාද කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඔබතුමා රීති ක්‍රියාත්මක කරන්න. ඔබතුමා රීති අනුව මේ සභාව මෙහෙය වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමා, අපි ගරු මහ ඇමැතිතුමාගේ යෝජනාවට එකඟයි. ඒ නිසා එතුමාට කාලය දෙන්න. ඒක කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කබරගොයා තලගොයා වෙලා.

[සභාවේ ඝෝෂා]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඊයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමුළුව සාර්ථකයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යූ.ඇන්.පී.යේ බොර දියේ මාළු බාන අය ඉන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෛත්‍රීට භය වෙලා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, සීනුව නාද කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපි මහින්දගේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් මෙරිල් ගරු මන්ත්‍රීතුමා මහින්දගේ නැහැයිලු. මෙරිල් නැහැයි ලු. ඔබතුමන්ලාගේ නායකයා නැහැයිලු. ඊළඟ පාර නායකකම හම්බ වෙයි එහෙනම්. මෙරිල් හැලිලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ බෙදීමක් තිබෙන නිසා ඡන්දයකට යන්න දැන් සූදානම් වෙන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ සභාව සභා රීතිවලට අනුව ක්‍රියාත්මක කරන්න. ඔබතුමා මේ සභාවේ රීති උල්ලංඝණය කරනවා. සභා රීති 64(3).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

64(3). සාකච්ඡා කළ නොහැක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ආණ්ඩුකාරතුමා විසින් මා වෙත එවන ලද ලිපිය මම ඔබතුමන්ලාට ප්‍රකාශ කළා. ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගරු සභාවෙන් ඉල්ලීමක් කළා, එම පනත් කෙටුම්පත සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා මේ මස 11 වැනි සඳුදා නැවත සභාව කැඳවන්න කියලා. ඒ පිළිබඳව ගරු සභාවේ බෙදීමක් ඇති නිසා මට ඡන්දයකට යන්න සිද්ධ වුණා. බෙදීමක් තිබෙන නිසා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා නිවැරැදි කරන්න. ආණ්ඩුකාරතුමාගේ ලියුමේ නැහැ, 11 වැනිදා දක්වා කල් දාන්න කියලා. එතුමාගේ ලියුමේ තිබෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. එතුමාගේ ලියුමේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, අපට හොඳට සිංහල තේරෙනවා. එතුමාගේ ලියුමේ තිබෙන්නේ -

[සභාවේ ඝෝෂා]

පොඩ්ඩක් ඉන්න. කියනකන් ඉන්න. එතුමාගේ ලියුමේ තිබෙන්නේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මහ ඇමැතිගේ ඉල්ලීමට.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

12 වැනිදායින් ඉස්සෙල්ලා දැනුම් දෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. දැනුම් දෙන්න කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැතුව එතුමා කියලා නැහැ, අද අපි රැස් වෙලා 11 වැනිදාට කල් දාන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් මහ ඇමැතිතුමා කියනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා ඒක හරියට කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමා යෝජනා කළා නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක මහ ඇමැතිගේ ඉල්ලීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාරතුමා කොහෙවක්වත් කියලා නැහැ. මහ ඇමැතිතුමා යෝජනා කළා. දැන් කරුණාකරලා ඡන්දය ගන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙමනම් කියන්න මහ ඇමැතිතුමාගේ ඉල්ලීමට කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න කෝ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාවට පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා නැඟී සිටින්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

හැබැයි, මේ ඡන්ද විමසීම රීති විරෝධියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ඔබතුමා නිශ්ශබ්ද වන්න. ඔබතුමා බොරුවට අනවශ්‍ය විධියට කෑ ගහන්න එපා.

[සභාවේ සෝෂා]

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ ස්ථානයේ රැඳී සිටින්න.

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 77 යි, විරුද්ධව 05 යි, වැළකුණු 02 යි යනුවෙන් බෙදුණේය.***
*Question put and the Council divided as per Rule No 61 (3), 77 for, 05 against and 02 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා දිනය ඉදිරිපත් කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, හරි ආසයි. සභානායකතුමයි, නියෝජ්‍ය සභාපතිතුමයි ගරු මහ ඇමැතිතුමාට කීකරු වුණා.

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න.

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, *"අද දින විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව, 2017 සැප්තැම්බර් මස 11 වැනි සඳුදා දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු යැයි "* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභා කටයුතු ඇමැතිතුමා විසින් යෝජනා කළා ගරු සභාව 2017.09.11 වැනි දින රැස්වීමට. ඒ පිළිබඳව සභාවේ දැන් ප්‍රශ්නයක් නැහැ. සභාව එකඟ වුණා. මම මේ අවස්ථාවේදී ඉතාමත්ම ගෞරවයෙන් සභා කටයුතු කාරක සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරනවා. 2017.09.11 දින පැවැත්වෙන සභා රැස්වීම පිළිබඳව සාකච්ඡා කිරීමට මගේ නිල කාමරයට සභා කටයුතු කාරක සභාව නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට පැමිණෙන ලෙස. ගරු සභානායකතුමා -

# කල් තැබීමේ යෝජනාව
ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"මෙම සභාව 2017.09.11 සඳුදා දින පෙ.ව. 09.30 දක්වා කල් තැබිය යුතු යැයි" යෝජනා කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 10.02 ට, 2017 සැප්තැම්බර් මස 11 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 10.02 a.m till 09.30 a.m, on 11.09.2017.*